ඌවපරණගම ප්‍රාදේශීය සභාව

බදුල්ල දිස්ත්‍රික්කය

-------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 26 වන දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 17 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 24 දිනද, සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට ඌවපරණගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. .30,935,413 ක ඉඩම් හා ගොඩනැඟිලි මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදි ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භෞතිකව නොපවතින රු.5,470,180 ක කුට්ටි ගල් තොග ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | පළාත්පාලන කොමසාරිස් වරයාගේ ලිඛිත උපදෙස් පරිදි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ මුදල රු.10,800,000 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල එය රු.7,681,502 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදි නිවැරදි කරමි. |

## 1.4 අනුකූල නොවීම්

**නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්.**

| නීති,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා(මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | | | |
| රීති 114 | සභාව විසින් අවස්ථා 05කදී දෙන ලද රු. 340,905 ක අත්තිකාරම් වසර 09 ක් ගතවී තිබුණද පියවා ගෙන නොතිබුණි. | අත්තිකාරම් පියවා ගත යුතුවේ. | කර්මාන්ත කිපයක් නිමකර ඇති බැවින් ඒ සඳහා ගෙවීම් අත්තිකාරම් වටිනාකම පොත් වලින් ඉවත්කර ගැනිමට පළාත් පාලන කොමසාරිස්වරයා වෙත යොමුකර ඇත. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| මුදල් රෙගුලාසි 571 (3) | වසර 02 ක් ඉක්මවූ රු.326,562 ක තැන්පතු 41 ක් නිරවුල් කර නොතිබුණි. | ඉකුත් තැන්පතු නියාදනය කළ යුතුවේ. | 2020 වසරේදි මෙම තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,356,170 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,487,108 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල්කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
|---|---|---|---|---|---|---|---|---|---|
| i | වරිපනම් හා බදු | 2,719,540 | 2,882,453 | 2,363,420 | 827,215 | 2,519,540 | 2,910,964 | 2,242,372 | 668,592 |
| ii | කුලී | 875,000 | 1,008,535 | 898,054 | 262,983 | 1,289,000 | 1,293,844 | 938,913 | 354,931 |
| iii | බලපත්‍ර ගාස්තු | 1,100,000 | 1,100,000 | 1,176,525 | - | 965,000 | - | - | - |
| iv | වෙනත් ආදායම් | 1,253,000 | 2,733,896 | 2,391,310 | 380,275 | 9,80,000 | 9,907,318 | 3,254,805 | 6,652,513 |
| | එකතුව | 5,947,540 | 7,724,884 | 6,829,309 | 1,470,473 | 4,773,540 | 14,112,126 | 6,436,090 | 7,676,036 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 03කට අධික කාලයක සිට පැවත එන හිඟහිටි වෙනත් ආදායම් රු.30,800,713 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අය කරගත යුතුවේ. | හිඟව පවතින මුදල් මෙම වර්ෂය තුල අයකර ගැනිමට කටයුතු කරමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උසාවි දඩ රු.7,681,502 ක් සහ මුද්දර ගාස්තු රු.7,000,000 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ සහ හිඟ මුද්දර ගාස්තු අය කරගත යුතුවේ. | මේ සඳහා පළාත් පාලන කොමසාරිස්වරයා මඟින් පළාත් සභාව වෙත ලිපි යොමු කර ඇත. මේවනවිට රු.1,500,000 ක මුදලක් ලැබී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වු කරුණු පහත දැක්වේ.

#### (අ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ඉදිරි වර්ෂයට සකස් කිරිමට විෂය නිලධාරි වෙත ලිඛිතව දන්වා ඇත. |

**(ආ)** **තිරසර සංවර්ධන ඉලක්ක**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යායපත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද,සභාවට අදාළ කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | සනීපාරක්ෂක පහසුකම් නොමැති ජනතාවට අදාල පහසුකම් සැපයීමට කටයුතු කරමින් පවති. |

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- | --- |
| (අ) | බාහිර පාර්ශවයන්ට කුලියට ලබාදී තිබුණු කඩ කාමර 82 න් කඩ කාමර 32 ක කුලී ගිවිසුම් අවසන්වී වසර 01 සිට වසර 09 දක්වා කාලයක් ගතවී තිබුණද, එම ගිවිසුම් අලුත් කර නොතිබුණු අතර, හිඟ කඩකුලී රු.195,069 ක් අය කරගෙන නොතිබුණි. | නියමිත කාලයට ගිවිසුම් අලුත් කර ගත යුතුවේ. | මේවනවිට කඩ කාමර 20 ක පමණ ගිවිසුම් යාවත්කාලීන කර ඇති බව හා එදිනට හිඟ මුදලින් රු.166,047 ක් අයකර ඇති බවත්, හිඟය අයකර ගැනීමට හා කුලී ගිවිසුම් යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |
| (ආ) | වසර 03 කට අධික කාලයක සිට පැවත එන ණය හිමියෝ රු19,060,269 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ණය ශේෂ නිරවුල් කළ යුතුවේ. | මේවන විට රු.4,540,891 ක ණයහිමියන් පියවා ඇත. |

**3.3** **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ඉදිරි වර්ෂයට සකස් කිරිම සඳහා විෂය නිලධාරි වෙත ලිඛිතව දන්වා ඇත. |

**3.4 <u>මානව සම්පත් කළමනාකරණය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 04 කට අදාළව සේවක අතිරික්තය 12 ක් සහ තනතුරු 02 කට අදාළව සේවක පුරප්පාඩු 02 ක් පැවතුනි. | කාර්ය මණ්ඩලය විධිමත් කරගත යුතුවේ. | අතිරික්ත තනතුරු අනුමත කරගැනිම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. පුරප්පාඩු පිළිබඳ පළාත් පාලන කොමසාරිස්වරයා දැනුවත් කර ඇත. |

**3.5 <u>වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව සමීක්ෂණයට ඉදිරිපත් නොවූ රු.61,614 ක් වටිනා පුස්තකාල පොත් 498 ක ඌනතාවය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | විගණන හා කළමනාකරණ කමිටුවේදි සාකච්ඡා කර පියවර ගැනීමට කටයුතු කරමි. |

**4. <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>**

**4.1 <u>විගණන හා කළමනාකරණ කමිටු</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | කාර්තුවකට එක් වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | මෙම වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා පළාත් පාලන කොමසාරිස්ගෙන් දින ඉල්ලා ඇත. |